## 18. ප්‍රසූති නිවාඩු

18:1 ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධාරිනීන්ට මෙම වගන්තිය යටතේ ප්‍රසූති නිවාඩු හිමි වේ.

18:2 **වැටුප් සහිත ප්‍රසූති නිවාඩු**

18:2:1 නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම රජයේ වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි වේ. දරු ප්‍රසූතිය සිදු වී සති 04ක් යාමට පෙර නිලධාරිනියට යලිත් රාජකාරියට වාර්තා කිරීමට ඉඩ නොදෙනු ඇත. මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා වෛද්‍ය සහතිකයක් හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ ඉදිරිපත් කළ යුතු ය.

18:2:2 ප්‍රසූති නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුළට පැමිණෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින ඊට ඇතුළත් නොකළ යුතු ය.

18:2:3 මෙම නිවාඩු කාලය නිලධාරිනියගේ ඉතිරිව තිබෙන නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර, මෙම නිවාඩු කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලෙස සැලකිය යුතු ය.

18:2:4 උපතේදීම මරණය සිදුවන දරු උපතකදී සහ දරු ප්‍රසූතියෙන් සති 6ක් ඉක්මවා යාමට පෙර දරුවා මරණයට පත්වන අවස්ථාවකදී දරුවාගේ මරණ සහතිකය හෝ වෛද්‍ය සහතිකය හෝ ඉදිරිපත් කළ විට විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදු වූ දින සිට සති 6ක නිවාඩුවක් දිය යුතු ය.

18:3 අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු

18:3:1 ඉහත සඳහන් 18:2:1 උප වගන්තියේ විධිවිධාන අනුව නිවාඩු ලබා ගැනීමෙන් අනතුරුව දරුවා රැක බලා ගැනීම වෙනුවෙන් දින 84ක අඩ වැටුප් සහිත නිවාඩුවක් හිමිවේ.

18:3:2 අඩ වැටුප් නිවාඩු කාල පරිච්ඡේදය අතරට වැටෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින අඩ වැටුප් නිවාඩු ලෙස සැලකිය යුතු ය.

18:4 වැටුප් රහිත ප්‍රසූති නිවාඩු

18:4:1 ඉහත 18:3:1 උප වගන්තිය යටතේ අනුමත කරන ලද නිවාඩු අවසන් වීමෙන් පසුව තවදුරටත් දරුවා රැක බලා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ නම් පමණක් වැටුප් රහිත දින 84ක නිවාඩු ලබා දිය හැකි ය.

18:4:2 මෙම වගන්තිය යටතේ ලබා දෙන නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුළට වැටෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින ඊට ඇතුළත් කළ යුතු ය.

18:4:3 මෙම නිවාඩු ලබා දීමට පෙර නිලධාරිනියට ලබාදී ඇති ණය හෝ අත්තිකාරමක, මාසික වාරික නොකඩවා අය කර ගැනීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු ය.

18:5 ගබ්සාවීමක් හේතුකොට ගෙන අවශ්‍ය නිවාඩු වෛද්‍ය සහතිකයක් මත නිලධාරිනියට හිමි විවේක නිවාඩුවලින් ලබාගත හැකි ය.

18:6 මෙහි 18:2:1 උප වගන්තිය යටතේ ලබා ගත් නිවාඩු කාලය අවසන් වීමෙන් අනතුරුව 18:3:1 උප වගන්තියේ සඳහන් නිවාඩු ලබා නොගන්නේ නම් තම දරුවාට මව්කිරි දීම සඳහා සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැයකට කලින් සේවා ස්ථානයෙන් පිටත්ව

යාමට ඔවුනට අවසර දිය යුතු ය. මෙම අවසරය දිය යුත්තේ දරුවාට වයස මාස 06ක් (හයක්) සම්පූර්ණ වනතුරු පමණි.

18:7 තවද නිලධාරිනියකට ගර්භනී අවස්ථාව මාස 05ක් වූ විට රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමට ද සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැය භාගයකට ප්‍රථම පිටවීමට ද ඉඩ දෙනු ලැබේ. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ නිලධාරිනිය ප්‍රසූති නිවාඩු ලබා ගන්නා තෙක් පමණි.

18:8 ඉහත 18:3:1, 18:4:1 උප වගන්ති යටතේ සඳහන් නිවාඩු අනුමත කරනුයේ දරුවා ජීවතුන් අතර සිටින විටදී පමණි. නිවාඩු ලබාගන්නේ දරුවා රැක බලා ගැනීමට බැවින් යම් හෙයකින් දරුවා මිය ගියහොත් එයින් දින හතකට පසුව මෙම නිවාඩු අවලංගු වේ.

18:9 ඉහත 18:3:1, 18:4:1 උප වගන්ති යටතේ ලබා දෙන නිවාඩු වැටුප් වර්ධක කාර්යයන් සඳහා ද විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ද බාධාවක් නොවිය යුතු ය. වැටුප් රහිත නිවාඩු කාලය තුළ ඇතිවන පුරප්පාඩුවලදී ද, උසස්වීම් ලබා දීම සඳහා ද එම නිවාඩු කාලය අවහිරයක් සේ නොසැලකිය යුතු ය.

18:10 නිලධාරිනිය ඉහත 18:3:1, 18:4:1 උප වගන්තිවල සඳහන් නිවාඩුවල කොටසක් අවලංගු කර සේවයට වාර්තා කිරීමට කැමැත්ත දක්වන අවස්ථාවකදී දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැන්වීමෙන් එසේ කළ හැකි ය.

18:11 පීතෘත්ව නිවාඩු

18:11:1 රජයේ ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධරයෙකුගේ භාර්යාවට දරුවකු ඉපදීම වෙනුවෙන් වැඩ කරන දින 03ක විශේෂ පීතෘත්ව නිවාඩුවක් ලබා ගැනීමට හිමිකම ඇත.

18:11:2 ඉහත 18:11:1 උප වගන්තිය යටතේ හිමිකම් ලබන නිවාඩුව දරු උපතේ සිට මාස 03ක කාලයක් ඇතුළත ලබා ගත යුතු ය.

18:11:3 ඉහත 18:11:1 උප වගන්තිය යටතේ නිවාඩු ලබා ගන්නා නිලධරන් තම විවාහ සහතිකය සහ දරු උපත පිළිබඳව නිකුත් කරන ලද වෛද්‍ය සහතිකය හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ පසුව ඉදිරිපත් කර විශේෂ නිවාඩුවේ හිමිකම සනාථ කරගත යුතු ය.